# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1989 අංක 5 දරන බදු සමා පනත

[සහතිකය සටහන් කළේ 1989 මැයි මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1989 මැයි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිළ : ශත 90 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1989 අංක 5 දරන බදු සමා පනත

[සහතිකය සටහන් කළේ 1989 මැයි මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 10/89

**තැනැත්තකු විසින් ආදායම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර නොමැත්තා වූ හෝ ආදායම් බදු පැනවීමට අදාළ නීතිය යටතේ එම තැනැත්තා විසින් සැපයිය යුතු වාර්තාවක හෙළිදරව් කර නොමැත්තා වූ සමුච්චිත ලාභ සහ ආදායම දැක්වෙන මුදල්, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ විශේෂ ගිණුම්වල තැන්පත් කිරීමට අවස්ථාව සැලසීම පිණිස ද, එම විශේෂ ගිණුම්වල තැන්පත් කරන ලද මුදල් සම්බන්ධයෙන් බද්දක් පනවා අය කිරීම පිණිස ද, එම විශේෂ ගිණුම්වල තැන්පත් කරන ලද මුදල් නිශ්චිත කාර්යයන් සඳහා ආපසු ලබා ගැනීමට අවස්ථාව සැලසීම පිණිස ද, එම විශේෂ ගිණුම්වල මුදල් තැන්පත් කරන තැනැත්තන්, එම මුදලින් දැක්වෙන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් ඇතැම් බදු ගෙවීමට යටත් වීමෙන් සහ එම ලාභවලට සහ ආදායම්වලට අදාළ වැරදි සඳහා නඩු පවරනු ලැබීමෙන් ආරක්ෂා කරනු පිණිස ද, ඒවාට සම්බන්ධ වූ හෝ ආනුෂංගික කරුණු සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

**1.** මේ පනත 1989 අංක 5 දරන බදු සමා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 1989 අප්‍රේල් මස 1 වන දින සිට, එය ක්‍රියාත්මක විය යුතු ය.

මේ පනත අදාළ වන තැනැත්තන්.

**2.** (1) ආදායම් බදු පැනවීමට අදාළව තත් කාලයෙහි බල පවත්නා නීතිය යටතේ 1988 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර ලැබුණු හෝ උපචිත වූ යම් ලාභ සහ ආදායම වෙනුවෙන්, 1988 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු හෝ ආදායම් බදු මත අධිභාරයක් 1963 අංක 11 දරන මුදල් පනත යටතේ ව්‍යාපාර පිරිවැටුම් බද්දක් හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත යටතේ පිරිවැටුම් බද්දක් හෝ ගෙවීමට යටත් වන්නා වූ ද, එකී යම් තක්සේරු වර්ෂයක් සඳහා එම නීතියේ විධිවිධාන යටතේ ආදායම් වාර්තාවක් සපයා නොමැත්තා වූ හෝ එකී යම් තක්සේරු වර්ෂයක් සඳහා එම පනතේ විධිවිධාන යටතේ තමා විසින් සපයන ලද යම් වාර්තාවක එම ලාභ හෝ ආදායම හෙළිදරව් කිරීම පැහැර හැර ඇත්තා වූ ද යම් තැනැත්තකුට, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව මේ පනත අදාළ විය යුතු ය.

(2) 1988 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර ලැබුණු හෝ උපචිත වූ යම් ලාභ සහ ආදායම හෝ පිරිවැටුම සම්බන්ධයෙන් තත් කාලයේ ආදායම් බදු පැනවීමට අදාළ නීතියේ විධිවිධාන යටතේ ගෙවිය යුතු ආදායම් බදු හෝ ආදායම් බදු මත වූ අධිභාරයක් හෝ ගෙවීම මග හැරියේ යයි කියනු ලැබීමක් හෝ සැක කරනු ලැබීමක් සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකු විසින් හෝ විමර්ශන ආරම්භ කර ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට මේ පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

2—ඩී 004417—8,080 (89/04)

(3) (2) වන උපවගන්තියෙහි විධිවිධාන අදාළ වන තැනැත්තකු නොවන (1) වන උපවගන්තියෙහි සඳහන් සෑම තැනැත්තකු ම, මින් මතු මේ පනතෙහි "මේ පනත අදාළ වන තැනැත්තකු" යනුවෙන් හඳුන්වනු ලැබේ.

*මේ පනත අදාළ වන තැනැත්තන් විසින් බැංකුවෙහි විශේෂ ගිණුම්වල මුදල් තැන්පත් කළ හැකි බව.*

3. මේ පනත අදාළ වන්නා වූ යම් තැනැත්තකුට, ආදායම් බදු හෝ ආදායම් බදු මත අධිභාරයක් හෝ පැනවීමට අදාළව තත් කාලයේ බල පවත්නා නීතිය යටතේ, ඒ තැනැත්තා විසින් ආදායම් වාර්තාවක් සපයනු නොලැබූ හෝ ඒ තැනැත්තා විසින් සපයන ලද ආදායම් වාර්තාවක ඔහු විසින් හෙළිදරව් කරනු නොලැබූ සමුච්චිත ලාභ හෝ ආදායම හෝ නියෝජනය කෙරෙන මුදල් තිබෙන අවස්ථාවක, ඒ තැනැත්තා විසින්, තත් කාර්යය සඳහා බැංකුවෙහි විවෘත කරනු ලබන කිසියම් විශේෂ ගිණුමක, එම මුදල්, 1989 ජූනි 30 වන දින හෝ එදිනට පෙර හෝ ඔහුගේ බැරට තැන්පත් කරනු ලැබිය හැකි ය.

*බැංකුවේ විශේෂ ගිණුමක තැන්පත් කරන ලද මුදලින් සියයට 20 කට සමාන බද්දක් අය කිරීම.*

4. (1) 3 වන වගන්තියේ විධිවිධාන යටතේ බැංකුවේ විශේෂ ගිණුමෙහි මුදල් තැන්පත් කරන සෑම තැනැත්තකු ම—

(අ) මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියෙහි වූ ප්‍රකාශයක් බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු ය; තව ද

(ආ) එසේ තැන්පත් කරන ලද මුදලින් සියයට 20 කට සමාන මුදලක බද්දක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවීමට යටත් විය යුතු ය.

(2) යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද, 3 වන වගන්තියෙහි සඳහන් පරිදි එවැනි යම් විශේෂ ගිණුමක එම තැනැත්තාගේ බැරට තිබෙන මුදල්වලින් බැංකුව විසින් 1989 ජූලි මස 31 වන දින හෝ එදිනට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවිය යුතු ය.

(3) 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ එවැනි යම් විශේෂ ගිණුමක යම් තැනැත්තකුගේ බැරට තිබෙන්නා වූ මුදල්වලින් (2) වන උපවගන්තිය යටතේ බැංකුව විසින් කොමසාරිස් ජනරාල්වරයාට බද්ද ගෙවීමට එම තැනැත්තා විසින් බලය දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, එම බද්ද එම තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවන ලද සේ සලකනු ලැබිය යුතු ය.

*විශේෂ ගිණුම්වල තැන්පත් කරන ලද මුදල් ආපසු ලබා ගැනීම සීමා කිරීම.*

5. 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ එවැනි යම් විශේෂ ගිණුමක මුදල් තැන්පත් කර ඇති යම් තැනැත්තකුට, 6 වන වගන්තියෙහි නිශ්චිත කාර්යයන් සඳහා හැර, 4 වන වගන්තියෙහි සඳහන් බද්දක් ගෙවීමෙන් පසුව එම විශේෂ ගිණුමෙහි එම තැනැත්තාගේ බැරට ඉතිරිව ඇති සම්පූර්ණ මුදල හෝ ඉන් කොටසක් හෝ (එම ඉතිරි මුදලට එකතු වන පොලිය හැර) 1991 ජූලි මස 1 වන දිනට පෙර ආපසු ලබා ගැනීමට වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද බැංකුව විසින් ඉඩ නොදිය යුතු ය.

6. (1) 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ එවැනි යම් විශේෂ ගිණුමක මුදල් තැන්පත් කර ඇති යම් තැනැත්තකුට, 4 වන වගන්තියෙහි සඳහන් බද්ද ගෙවීමෙන් පසුව එම විශේෂ ගිණුමෙහි ඔහුගේ බැරට ඉතිරිව ඇති මුදල 1991 ජූනි මස 30 වන දිනට පසුව ආපසු ලබාගත හැකි ය : විශේෂ ගිණුම්වල තැන්පත් කරන ලද මුදල් ආපසු ලබාගත හැකි කාර්යයන්.

එසේ වුවද, එම සම්පූර්ණ මුදල හෝ ඉන් කොටසක් හෝ—

(අ) තැනැත්තන් දස දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකට රැකියා සලසන්නා වූ ද, ජනසවිය වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම භාර අමාත්‍යවරයා විසින් අනුමත කර ඇත්තා වූ ද, කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යාපෘතියක ආයෝජනය කිරීම සඳහා ; හෝ

(ආ) 1989 ජනසවිය අරමුදල් පනත මඟින් පිහිටුවන ලද ජනසවිය අරමුදලට ප්‍රදානයක් කිරීමේ කාර්ය සඳහා

1980 ජූලි මස 31 වන දිනයෙන් පසුව ආපසු ලබාගනු ලැබිය හැකි ය.

(2) 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ එවැනි යම් විශේෂ ගිණුමක තමාගේ බැරට තිබෙන මුදල්, 6 වන වගන්තියේ අතුරු වගන්තියෙහි නිශ්චිත යම් කාර්යයක් සඳහා 1989 ජූලි මස 31 වන දිනට පසුව ආපසු ලබාගන්නා යම් තැනැත්තකු, ඒ මුදල් ආපසු ලබාගන්නා ලද කාර්ය සඳහා ඒ මුදල් යොදා ගැනීම පැහැර හරින අවස්ථාවක, එම තැනැත්තා මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය. තව ද, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ආපසු ලබාගන්නා ලද මුදලට සමාන මුදලකට සහ රුපියල් පණස් දහසකට වැඩි නොවන්නා වූ දඩයකට ඔහු යටත් විය යුතු ය.

(3) 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ එවැනි යම් විශේෂ ගිණුමක තමාගේ බැරට තිබෙන මුදල් 1989 ජූලි මස 31 වන දිනට පසුව ආපසු ලබා ගෙන 6 වන වගන්තියේ අතුරු වගන්තියෙහි නිශ්චිත කාර්යයන්ගෙන් කිසිවක් සඳහා ඒ මුදල් යොදා ගන්නා වූ යම් තැනැත්තකුගේ 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ හැකි ආදායම් ආගණනය කිරීමේ දී, වෙනත් යම් නීතියක කුමක් සඳහන් ව ඇත ද, එසේ යොදවන ලද මුදල් වෙනුවෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීමකට ඉඩ නොදිය යුතු ය.

7. 4 වන වගන්තියෙහි සඳහන් බද්ද ගෙවීමෙන් පසුව, 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ එවැනි යම් විශේෂ ගිණුමක යම් තැනැත්තකුගේ බැරට තිබෙන ඉතිරි මුදල සම්බන්ධයෙන්, වෙනත් ඉතිරි කිරීමේ ගිණුම්වල බැරට ඇති මුදල් මත බැංකුව විසින් ගෙවිය හැකි පවත්නා පොලී ප්‍රමාණය අනුව පොලියක්, විශේෂ ගිණුම්වල තැන්පත් කරන ලද මුදල් සම්බන්ධයෙන් පොලිය.

බැංකුව විසින් ගෙවිය යුතු ය. එසේ උපචිත වන පොලිය එම තැනැත්තා විසින් 1989 ජූලි මස 31 වන දිනයෙන් පසුව ආපසු ලබා ගනු ලැබිය හැකි ය.

**4 වන වගන්තියෙහි සඳහන් බද්ද ගෙවා ඇතැයි සලකනු ලබන තැනැත්තන් ඇතැම් බදු වලින් සහ තඩු පැවරීම්වලින් ආරක්‍ෂා කිරීම.**

8. 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ, එවැනි යම් විශේෂ ගිණුමක මුදල් තැන්පත් කරනු ලැබුවා වූ ද, 4 වන වගන්තියෙහි සඳහන් බද්ද ගෙවා ඇතැයි ඒ වගන්තිය යටතේ සලකනු ලබන්නා වූ ද, මේ පනත අදාල වන යම් තැනැත්තකු—

(අ) (i) 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ, සමුච්චිත ලාභයේ හෝ ආදායමේ හෝ මුදලින් දැක්වෙන, 1988 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර හෝ ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරයක් හෝ පැනවීමට අදාළ නීතිය යටතේ කිසියම් ආදායම් බද්දක් හෝ ආදායම් බද්ද මත අධිභාරයක් ;

(ii) 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ සමුච්චිත ලාභය හෝ ආදායම හෝ යොදනු ලැබුවේ 1988 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර හෝ අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ ඔහුගේ ශුද්ධ ධනය ලබා ගැනීම සඳහා ද, ඔහුගේ ඒ ශුද්ධ ධනය සම්බන්ධයෙන්, ධන බද්ද හෝ ධන බද්ද මත අධිභාරයක් හෝ පැනවීමට අදාළව තත් කාලයේ බලපවත්වන නීතිය යටතේ කිසියම් ධන බද්දක් හෝ ධන බද්ද මත අධිභාරයක් ; හෝ

(iii) 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ සමුච්චිත ලාභවල හෝ ආදායමෙහි හෝ මුදල, බිහිවූයේ නැතහොත් ලැබුණේ යම් පිරිවැටුම සම්බන්ධයෙන් 1963 අංක 11 දරන මුදල් පනත යටතේ වූ යම් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත යටතේ යම් පිරිවැටුම් බද්දක් ගෙවීමට ; හෝ

(ආ) (i) 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ සමුච්චිත ලාභයේ හෝ ආදායමේ හෝ සම්පූර්ණ මුදල නැතහොත් ඉන් කොටසක් වෙනුවෙන් හෝ ඊට සම්බන්ධව හෝ 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ සමුච්චිත ලාභවල හෝ ආදායමෙහි සම්පූර්ණ මුදල හෝ ඉන් කොටසක් හෝ යොදවනු ලැබ ඇත්තේ යම් ධනයක් අත්කර ගැනීම සඳහා ද, ඒ ධනය වෙනුවෙන් හෝ ඊට සම්බන්ධව, 1988 මාර්තු මස 31 වන දින හෝ එදිනට අවසන් වන තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරයක් නැතහොත් ධන බද්ද හෝ ධන බද්ද මත අධිභාරයක් පැනවීමට අදාළව තත් කාලයෙහි බලපවත්නා වූ නීතිය ; හෝ

(ii) 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ සමුච්චිත ලාභවල හෝ ආදායමෙහි මුදල බිහිවූයේ නැතහොත් ලැබුණේ යම් පිරිවැටුමක් සම්බන්ධයෙන් ද, 1989 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම් කාල සීමාවක් සඳහා ඒ පිරිවැටුමට අදාළ ව, 1963 අංක 11 දරන මුදල් පනත හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත ; හෝ

යටතේ යම් වරදක් සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීමට හෝ දණ්ඩනයට යටත් නොවිය යුතු ය.

කලින් කරන ලද යම් තක්සේරුවක් මේ පනතේ ඉහත දැක්වෙන විධිවිධාන මගින් ප්‍රතිශෝධනය කිරීමට බලය පැවරෙනැයි නොසැලකිය යුතු බව.

9. ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත වූ අධිභාරයක් හෝ ධන බද්ද හෝ ධන බද්ද මත වූ අධිභාරයක් හෝ පැනවීම පිණිස, තත් කාලයෙහි බලපවත්නා නීතියෙහි විධිවිධාන යටතේ කරන ලද යම් තක්සේරුවක් හෝ, එකී විධිවිධාන යටතේ අවසානාත්මක හා තීරණාත්මක වී ඇති වෙනත් යම් කාරණාවක් හෝ සංශෝධනය කිරීමට, ඉහත දැක්වෙන විධිවිධාන කිසිවකින් බලය පැවරෙන ලෙසට කියවා තේරුම් නොගත යුතු ය.

රහස්‍යතාව රැකීම.

10. (1) මේ පනත ක්‍රියාත්මක කිරීමේ දී තමන්ට දැන ගන්නට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන්, බැංකුවේ සෑම නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් ද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි සෑම නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් ද, රහස්‍යතාව රැකිය යුතු අතර, රහස්‍යතාව රැකීමට ආධාර කළ යුතු ය :

එසේ වුවද බැංකුවෙහි යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින්, 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ යම් විශේෂ ගිණුමකට අදාළ පහත දැක්වෙන විස්තර, මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කිරීමේ කාර්යය සඳහා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත හෝ යම් අධිකරණයක් වෙත හෝ දන්වා සිටිය හැකිය :—

ඒ විස්තර නම්—

(අ) ගිණුම් දරන්නාගේ නම සහ ආදායම් බදු ලිපිගොනුවේ අංකය ;

(ආ) යම් වෙළෙඳ ව්‍යාපාරයක් වේ නම් එහි නම සහ ආදායම් බදු ලිපිගොනුවේ අංකය ;

(ඇ) මුදල් තැන්පත් කළ දිනය හෝ ආපසු ලබාගත් දිනය ;

(ඈ) තැන්පත් කළ හෝ ආපසු ලබාගත් මුදල ;

(ඉ) එම විශේෂ ගිණුමට අදාළව 4(1) (අ) වන වගන්තිය යටතේ යම් ප්‍රකාශයක සඳහන් වෙනත් විස්තර.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව ක්‍රියා කරන, බැංකුවෙහි හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි හෝ යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් දහසකට වැඩි නොවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

අනනුකූලතාවක් සම්බන්ධයෙන් සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**12.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"කොමසාරිස් ජනරාල්වරයා", "ලාභ", "ආදායම්", "ධනය" සහ "තක්සේරු වර්ෂය" යන යෙදුම්වලට 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතෙහි පිළිවෙලින් ඒ සඳහා ඇති අර්ථයම විය යුතු ය;

"නත් කාලයෙහි ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය හෝ පැනවීමට අදාළ නීතිය" යන්නෙන් 1970 අංක 28 දරන දේශීය ආදායම් පනත සහ 1982 අංක 25 දරන ආදායම් බදු අධිභාර පනත සහ 1984 අංක 12 දරන ආදායම් බදු අධිභාර පනත අදහස් වේ;

"නත් කාලයෙහි ධන බද්ද හෝ ධන බද්ද මත අධිභාර පැනවීමට අදාළ නීතිය" යන්නෙන් 1970 අංක 28 දරන දේශීය ආදායම් පනත සහ 1982 අංක 25 දරන ධන බදු අධිභාර පනත අදහස් වේ;

"තැනැත්තා" යන්නට සමාගමක්, පුද්ගල මණ්ඩලයක් සහ හවුල් ව්‍යාපාරයක් අදහස් වේ;

"බැංකුව" යන්නෙන් 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත මගින් පිහිටුවන ලද ජාතික ඉතිරි කිරීමේ බැංකුව අදහස් වේ.

(4(1) (අ) වන වගන්තිය)

උපලේඛනය

1989 අංක 5 දරන බදු සමා පනත

4 (1) (අ) වන වගන්තිය යටතේ ප්‍රකාශය

ආදායම් බදු ලිපිගොනුවක් තිබේ නම් එහි අංකය :...................

විශේෂ සමාලාභි ඉතිරි කිරීමේ තැන්පත් ගිණුම් අංකය :................................

වෙළඳ ව්‍යාපාරයක් තිබේ නම් එහි නාමය :..................

දිනය :.....................

..........................................................

(ලිපිනය)

.......... .. .......හි......... .......................

(සම්පූර්ණ නම)

........................ මහතා/මහත්මිය/මෙනෙවිය වන මම/අපි

(1) (අ) ......................... හි ......................... ගේ නමින් විශේෂ සමාලාභි ඉතිරි කිරීමේ තැන්පත් ගිණුමක් තැබීම සඳහා රුපියල් ........................ (රු. ............) ක් 1989 අංක 5 දරන බදු සමා පනත ප්‍රකාර භාර ගන්නා ලෙසත්

(ආ) මේ මුදල මත ගෙවිය යුතුව ඇති රුපියල් ................................ (රු...............) ක් වන්නා වූ බද්ද කෙළින් ම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරන ලෙසත්

(ඇ) ඒ ගිණුමෙහි ඉතිරි මුදල එනම්—

ඉදිරිපත් කරනු ලද මුදල රු. ................

අඩු කළ යුතු 20% බද්ද අඩු කරන්න රු. .............

ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් විශේෂ සමාලාභි ඉතිරි කිරීමේ තැන්පත් ගිණුමෙහි රඳවා ගත යුතු ඉතිරි මුදල

රඳවා ගන්නා ලෙසත් මෙයින් ඔබගෙන් ඉල්ලා සිටිමි/සිටිමු.

(2) ඉහත සඳහන් පනතෙහි 6 වන වගන්තියෙහි නිශ්චිත කාර්යයක් සඳහා හැර, මේ ඉතිරි මුදලින් කොටසක් 1991 ජූලි මස 31 වන දිනට පෙර ආපසු ලබා නොගන්නා බවට මම/අපි පොරොන්දු වෙමි/පොරොන්දු වෙමු.

(3) මගේ/අපගේ විශේෂ සමාලාභි ඉතිරි කිරීමේ තැන්පත් පාස් පොත ඔබගේ බැංකුවේ ආරක්ෂා භාරයෙහි තැබීමට එකඟ වෙමි/වෙමු.

(4) නත් කාලයෙහි ඔබගේ බැංකුවේ ඉතිරි කිරීමේ තැන්පත්වලට අදාළ වන සහ කලින් කල ක්‍රියාත්මක වන රීතිවලින් බැඳී සිටීමට ද වැඩිදුරටත් මම/අපි එකඟ වෙමි/වෙමු.

තැන්පත්කරුගේ අත්සන.

මා ඉදිරිපිට දී අත්සන් තබන ලදී.

ශාඛා කළමනාකරුගේ අත්සන.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 2[illegible]6 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.